TRANSPORTATION, WAREHOUSING & LOGISTICS (Part-IV)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics)

ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) යනු පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් භාණ්ඩ, සේවා හා අදාළ තොරතුරු ඉදිරියට හා පසුපසට ගලා යාම, ඒවායේ ආරම්භක අවස්ථාවේ (point of origin) සිට පරිභෝජන අවස්ථාව (point of consumption) දක්වා කාර්යක්ෂම ව හා සඵලදායී ව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.

ආයතනයක මෙහෙයුම් කටයුතු සුමට ව ගලා යාම සඳහා සැලසුම් කරන ලද ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් අත්‍යවශ්‍ය වේ.

ClassWork.LK

ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක මූලික ක්‍රියාවලි

- අමු ද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීමේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා වූ චලනයන් (Inbound Logistics)

- නිෂ්පාදන ක්‍රියාවලිය අවසාන වූ අවස්ථාවේ සිට නිෂ්පාදිත හෝ අදාළ තොරතුරු අවසාන පාරිභෝගිකයා තෙක් සැපයීම දක්වා වූ චලනයන් (Outbound Logistics)

Vender → Manufacturer → Wholesaler → Retailer → Customer

විකුණුම්කරු (සැපයුම්කරු) | නිෂ්පාදකයා | තොග වෙළෙන්දා | සිල්ලර වෙළෙන්දා | පාරිභෝගිකයා

← Inbound Logistics → ← ← Outbound Logistics →

ClassWork.LK

ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති

ආයතනවල ස්වරූපය, නිෂ්පාදිතවල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති පැවතිය හැකි ය. ඒවා පහත පරිදි දැක්විය හැකි ය.

සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති Balanced Logistics Systems

එනම් අමුද්‍රව්‍ය හෝ නිෂ්පාදිත, ආයතන තෙක් ප්‍රවාහය හා නිෂ්පාදනයෙන් පසු නිෂ්පාදිත පාරිභෝගිකයා දක්වා ප්‍රවාහය සමාන පද්ධති

නිදසුන් :

නෙස්ලේ, යුනිලිවර් වැනි පාරිභෝගික භාණ්ඩ සපයන ආයතන

ClassWork.LK

නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති Heavy Inbound Logistics Systems

නිදසුන් :

ගුවන් යානා නිෂ්පාදන ආයතන

ගුවන්යානා නිපදවීමට අවශ්‍ය ද්‍රව්‍ය හා සේවා සපයා ගැනීමට විවිධ ආයතන හා රටවල් සම්බන්ධ වීම නිසා ක්‍රියාවලිය සංකීර්ණ වන නමුත් ගුවන්යානා අලෙවි කිරීමේ ක්‍රියාවලිය එතරම් සංකීර්ණ නො වේ.

නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති Heavy Outbound Logistics Systems

නිදසුන් :

රසායනික ද්‍රව්‍ය සමාගම්

රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම, ඇසිරීම හා ප්‍රවාහනය විශේෂ අවධානයකින් සිදු කළ යුතු බැවින් මෙම ක්‍රියාවලිය සංකීර්ණ වේ.

ClassWork.LK

නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති Reverse Logistics Systems

නිදසුන් :

ගෑස් සිලින්ඩර් වැනි ආපසු භාර දෙන ඇසුරුම්
භාවිත කළ ද්‍රව්‍ය ඉවතලෑම නිසා පරිසරයට සිදු වන බලපෑම් මේ තුළින් අඩුවේ.

ClassWork.LK

ප්‍රවාහන හා සැපයුම් සේවාවල අවශ්‍යතාව

- නිවැරදි නිෂ්පාදිතය, නිවැරදි ප්‍රමාණයෙන්, නිවැරදි වේලාවට, නිවැරදි ස්ථානයේ දී, නිවැරදි මිලට, හොඳ තත්ත්වයෙන්, නිවැරදි පාරිභෝගිකයාට සැපයීමට ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

- තොග පාලනය, නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිල දී ගැනීම, ප්‍රවාහනය, ගබඩාකරණය ආදී කාර්යයන් විධිමත් ව සිදු කිරීමට ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

- සෑම යන්ත්‍රයකට ම, සෑම වැඩ මධ්‍යස්ථානයකට ම, නියමිත ද්‍රව්‍ය, නියමිත ප්‍රමාණයෙන්, නියමිත ගුණත්වයෙන්, නියමිත වේලාවට ලැබෙන්නේ ද යන්න සහතික කර ගැනීමට ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

- වෙළෙඳපොළ පර්යේෂණ, අවශ්‍යතා සැලසුම් කිරීම, නිපදවන්නේ ද මිල දී ගන්නේ ද (make-or-buy) තීරණය කිරීම ආදිය තුළින් පිරිවැය අවම කර ගැනීමටත් සැලසුම් දාමය අඛණ්ඩ ව පවත්වා ගැනීමටත් ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

ClassWork.LK

ප්‍රවාහන හා සැපයුම් සේවාවල ප්‍රයෝජන

- නිෂ්පාදිත අඛණ්ඩ ව වෙළෙඳපොළට සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම

- සියලු ම කාර්යයන් සැලසුම් සහගත ව සිදු කිරීම නිසා නාස්තිය හා අපතය අවම වීම තුළින් පිරිවැය අවම කර ගත හැකි වීම

- තරගකාරිත්වයට ශක්තිමත් ව මුහුණ දීමට හැකි වීම

- යන්ත්‍ර සූත්‍ර, සේවකයන් වෙනුවෙන් දැරීමට සිදු වන අක්‍රීය පිරිවැය අවම කර ගත හැකි වීම

- නිෂ්පාදිතවල ගුණත්වය ආරක්ෂා කර ගත හැකි වීම

- අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු වීමෙන් ගැටලු මතු නො වීම

- කර්මාන්තය තුළ නායකයා බවට පත් විය හැකි වීම

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura